මැයි 09, 2022 දින නිට්ටඹුව ප්‍රදේශයේදී පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරළ ඝාතනය කළේ යැයි පැවසෙන සිදුවීම සම්බන්ධයෙන් ඉරිදා මව්බිම සහ අනිද්දා පුවත්පත් තුළ (මැයි 22, 2022) ලිපි පළවී තිබිණි.
එම සිදුවීම අතරවාරයේදී මන්ත්‍රීවරයාගේ ආරක්ෂක නිලධාරියා විසින් සිදුකළා යැයි පැවසෙන වෙඩි තැබීම පිළිබඳව මෙම පුවත්පත් දෙක තුළ පළවී තිබුණේ මෙසේයි.

ඉරිදා මව්බිම - "මන්ත්‍රී අමරකීර්ති අමු අමුවේ මරපු නිට්ටඹුව යුද්ධයේ හැංගුණු කතාව" (ආරක්ෂක නිලධාරියා මන්ත්‍රීවරයා කෙසේ හෝ බේරාගැනීමේ අරමුණින් රිවෝල්වරය ගෙන කොකා ගැස්සූ බවත්, එම වෙඩි පහරත් සමගින් මන්ත්‍රීවරයා වටා සිටි දෙතුන් දෙනෙකු බිම ඇදවැටුණු බවත් පවසයි.)

අනිද්දා - "මන්ත්‍රී අතුකෝරළ ඝාතනය: සැකකාර දෙදෙනෙක් හිටපු ආරක්ෂක අංශ සාමාජිකයෝ" (මන්ත්‍රීවරයාගේ ආරක්ෂකයා විසින් වෙඩි තබන ආකාරය දැක්වෙන සීසීටීවී දසුන් මාධ්‍ය තුල පළ වූ බවත්, එම වෙඩි තැබීමෙන් තරුණයන් දෙදෙනෙකු මිය ගිය බවත් පවසයි.)

මේ අනුව,

1) අනිද්දා පුවත්පත සඳහන් කර ඇති ආකාරයට, මෙම වෙඩි තැබීමෙන් දෙදෙනෙකු මිය ගිය බව සඳහන් කිරීම අවශ්‍ය යැයි ඔබ නොසිතන්නේ ද?

2) එම තොරතුර අන්තර්ගත නොවීම ඔස්සේ, මෙම සිදුවීමේ සමස්ත චිත්‍රය නොදැක්වෙන්නේ නොවේද?

ඔබේ අදහස?